# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1093/8 – 1999 අගෝස්තු 17 වැනි අඟහරුවාද – 1999.08.17

*1093 / 8 ஆம் இலக்கம் - 1999 ஆம் ஆண்டு ஓகத்து மாதம் 17 ஆம் திகதி செவ்வாய்க்கிழமை*

No. 1093 / 8 – TUESDAY, AUGUST 17, 1999

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) *(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)* (Published by Authority)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 21/78 iv.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 21 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය රිචඩ් පතිරණ වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මේ නියමය මගින් –

(අ) ව්‍යවහාරික විද්‍යා, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය, කෘෂිකර්මය හා වැවිලි කර්මාන්ත කළමනාකරණය සහ පශු සම්පත්, ධීවර සහ පෝෂණය යන අධ්‍යයන අංශයන්හි උසස් අධ්‍යාපනය සඳහා විධිවිධාන සැලැස්වීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා වූ විශ්වවිද්‍යාලයක් 1999 ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවමි ;

(ආ) ඒ විශ්වවිද්‍යාලයට " ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලය" යන නාමය හා අභිධානය පවරමි ;

(ඇ) ඒ විශ්වවිද්‍යාලය පිහිටා තිබිය යුතු ප්‍රදේශය වශයෙන් කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කය නියම කොට දක්වමි ;

(ඈ) ව්‍යවහාරික විද්‍යා, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය, කෘෂිකර්මය හා වැවිලි කර්මාන්ත කළමනාකරණය සහ පශු සම්පත්, ධීවර සහ පෝෂණය යන පීඨ ඒ විශ්වවිද්‍යාලයට පවරමි ; තව ද

(ඉ) මෙහි උපලේඛනයේ 1 වන තීරයේ දක්වා ඇති ඒ විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨය, ඒ උපලේඛනයේ 2 වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති අධ්‍යයන අංශවලින් සමන්විත විය යුතු බව නියම කොට දක්වමි.

රිචර්ඩ් පතිරණ,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය.

1999 අගෝස්තු මස 13 වන දින,
කොළඹ දී ය.

1 A – H 4237 – 1,360 (99/08)

## උපලේඛනය

| 1 වන තීරය | 2 වන තීරය |
|---|---|
| ව්‍යවහාරික විද්‍යා පීඨය | කාර්මික කළමනාකරණ අධ්‍යයන අංශය ;<br>ඉලෙක්ට්‍රොනික් විද්‍යා අධ්‍යයන අංශය ;<br>ගණිත විද්‍යා අධ්‍යයන අංශය;<br>පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයන අංශය ; |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | ගණක විද්‍යා අධ්‍යයන අංශය ;<br>බැංකු හා මූල්‍ය අධ්‍යයන අංශය ;<br>ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය ;<br>රක්ෂණ හා තක්සේරු අධ්‍යයන අංශය ; |
| කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත පීඨය | වැවිලි කර්මාන්ත කළමනාකරණ අධ්‍යයන අංශය ;<br>උද්‍යාන විද්‍යා හා දර්ශණීය භූමි අලංකරණ සැකසුම් අධ්‍යයන අංශය ;<br>කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයන අංශය ;<br>ජෛව තාක්ෂණවේදී අධ්‍යයන අංශය ; |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | ආහාර විද්‍යා හා තාක්ෂණවේදී අධ්‍යයන අංශය ;<br>ව්‍යවහාරික පෝෂණ අධ්‍යයන අංශය ;<br>පශු සම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයන අංශය ;<br>ජල ජීවී වගා හා ධීවර කර්මාන්ත අධ්‍යයන අංශය. |